# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 59 — 1973 මැයි 11 වැනි සිකුරාද — 1973.05.11

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යෙදී ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... ... | 466 |
| ජනාධිපතිතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | 463 | මිල පාලන දැන්වීම් ... ... | 474 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන පත් කිරීම් ආදිය ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරනු පත් කිරීම් ආදිය | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| අධිකරණ සේවා උපදේශක මණ්ඩලයෙන් කරන පත් කිරීම් ආදිය ... ... ... | 464 | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... | 466 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 475 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — | "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


**සැලකිය යුතුයි.**—(i) ඇසෝෂියේටඩ් නිවුස් පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත සහ බදු උගස්ගත්තන්ගේ (සංශෝධන) පනත් කෙටුම්පත 1973 අප්‍රේල් 27 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වෙනි කොටසේ අතිරේකයන් වශයෙන් පළකරන ලදී. (ii) ක්‍රීඩා පනත් කෙටුම්පත සහ ශ්‍රී ලංකා නැව් ඉඩපහසුකම් වෙන්කිරීමේ මධ්‍ය කාර්යාංශය පනත් කෙටුම්පත 1973 මැයි මස 04 වෙනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වෙනි කොටසේ අතිරේකයන් වශයෙන් පළ කරන ලදී.

## ජනාධිපතිතුමාණන් කරන පත් කිරීම් ආදිය

1973 අංක 249

අංකය : ඩී. 325/ආර්ජීසී.

**ශුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්**

පහත නම් සඳහන් නිලධාරීන් 1972 පෙබරවාරි මස 01 දින සිට ලුතිනන් කර්නල් වරුන් වශයෙන්:—

මේජර් කේ. ද එස්. ගුණවර්ධන, ලයුවෙබ.

මේජර් ජේ. එම්. කුමාරස්වාමි, ලයුවෙබ.

උතුමාණන් ව හන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 අප්‍රේල් මස 25 දින,
කොළඹ දී ය.

05–185—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම් සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම් සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.**

**1971 මාර්තු මස 19 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.**

**එල්. ඩබ්ලිව්. ෂී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

---

### 1973 අංක 250

අංකය : ඩී. 11/ආර්ඊසීඊ(111)

**යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරනලද අධිකාරයට පත් කිරීමක්**

ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් පහත නම සඳහන් කර ඇති අධිකාරී නොලත් නිලධාරී, 1967 දෙසැම්බර් මස 1 වැනි දින සිට යුද්ධ හමුදා ස්ථිර බල හමුදාවේ ලුතිනන් (උපකරණ පාලක) වරයෙක් වශයෙන්, ලුතිනන් ඩබ්. ඒ. සෝමපාල, ල. යු. යු. බ. ව ආසන්නවම ඔහුට ඉහලින් ජ්‍යෙෂ්ඨත්වය ඇතිවන අයුරු, අධිකාරයට පත්කිරීම හා එම දින සිට ඔහුගේ නම ඉදිරියෙන් සඳහන් කර ඇති බලකායට ඇතුලත් කිරීම අනුමත කිරීමට ප්‍රසාදය පළකොට ඇත.

සෙ/87036 තාවකාලික මාණ්ඩලික සැරයන් ගජනායක මුදලිගේ පියදාස—ලංකා යුද්ධ හමුදා යුද්ධායුධ බලකාය.

1969 ජනවාරි 1 වැනි දිනැති අංක 14,858 දරණ රජයේ ගැසට් පත්‍රයේ 1969 අංක 1 දරණ නිවේදනයේ මෙම අධිකාරී නොලත් නිලධාරී 1969 ජනවාරි 1 වැනි දින සිට අධිකාරයට පත්කිරීම සම්බන්ධයෙන් පළවූ සියළුම දෑ කපාහරින්න.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ ලේකම්.

1973 අප්‍රේල් මස 24 වැනි දින,
කොළඹ දී ය.

05-308—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

### 1973 අංක 251

අංකය : ඩී. 202/ආර්ඊසීඊ.

**ශ්‍රී ලංකා නාවික හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

1973 මැයි 31 වන දා සිට රියර් අද්මිරාල් වීමට—

කොමදෝරු ඩොනල්ඩ් වික්ටර් හන්ටර්.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ ලේකම්.

1973 අප්‍රේල් මස 27 දින,
කොළඹ දී ය.

05-198/1—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

### 1973 අංක 252

අංකය : ඩී. 202/ආර්ඊසීඊ.

**ශ්‍රී ලංකා නාවික හමුදාව—නිත්‍ය නාවික බලකාය—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරනලද විශ්‍රාම ගැනීමක්**

රියර් අද්මිරාල් ඩොනල්ඩ් වික්ටර් හන්ටර්, ශ්‍රී.ලං.නා.හා. 1973 ජූනි 1 වන දා සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය නාවික බලකායෙන් විශ්‍රාම ගැනීම ජනාධිපති උතුමාණන් වහන්සේ අනුමත කර තිබේ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ ලේකම්.

1973 අප්‍රේල් මස 27 දින,
කොළඹ දී ය.

05-198/2—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය.

---

## අධිකරණ සේවා උපදේශක මණ්ඩලයෙන් කරන පත්කිරීම් ආදිය

### 1973 අංක 253

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126(5) වැනි වගන්තිය ප්‍රකාර අමාත්‍ය මණ්ඩලය විසින් අධිකරණ සේවා උපදේශක මණ්ඩලයේ ලේකම් වෙත පවරන ලද බලතල යටතේ පහත සඳහන් වැඩ බැලීමේ පත්කිරීම් කර ඇත**

පී. ජේ. රාජරත්නම් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් පේදුරුතුඩුව දි. උ. අංක. 11777, 11136 සහ චාවකච්චේරි දි. උ. 2178/ඉඩම් දරන නඩු ඇසීමට සහ අසා අවසානකර තීන්දු දීම පිණිස 1973 අප්‍රේල් 30 දින සිට පේදුරුතුඩුව අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහේස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

ආර්. එල්. ද සිල්වා මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් නුවරඑළියේ ම. උ. අංක. 37265 දරණ නඩුව ඇසීමට සහ අසා අවසානකර තීන්දුව දීම පිණිස 1973 මැයි මස 9 දින සිට නුවරඑළිය අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහේස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

ඊ. එම්. වරුසවිතාන මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් ගම්පහ ම. උ. අංක. 46140/බී සහ 54725/බී දරණ නඩු ඇසීමට සහ අසා නිමකර තීන්දු දීම පිණිස 1973 අප්‍රේල් මස 30 වැනි දින සිට ගම්පහ අතිරේක මහේස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහේස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

1973 මාර්තු මස 19 සිට 21 දක්වා ඩබ්ලිව්. ජී. එන්. වීරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ජේ. ආර්. ජයවර්ධන මහතා හොරණ ක්‍රියා කරන පානදුර අතිරේක මහේස්ත්‍රාත් තැන අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහේස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

1973 මාර්තු මස 22 සිට 24 දක්වා ඩබ්. ජී. එන්. වීරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ටී. වී. කන්තන්ගර මහතා හොරණ ක්‍රියා කරන පානදුර අතිරේක මහේස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහේස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

1973 අප්‍රේල් මය 4 දින ආර්. ඩී. බී. ජයසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, කේ. ඩී. සේනවිර මහතා අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහේස්ත්‍රාත් තැන, අතිරේක මහේස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

1973 අප්‍රේල් මස 18 සහ 19 දිනයන්හි එල්. එම්. ජයරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එල්. ඩී. විජේගුණවර්ධන මහතා කළුතර අතිරේක මහේස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන අතිරේක ළමා මහේස්ත්‍රාත් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට

1973 මැයි මස 2 දින සිට 9 වැනි දින දක්වා ඊ. ගනේගොඩ මහතා කොළඹ අංක. 14 14/1022/72 සිට 14/1025/72 දක්වා, 14/1026/72 සිට 14/1029/72 දක්වා 333/71, 698/71, 373/71, 785/72, 534/71 දරණ නඩු ඇසීමට හා අසා නිමකර තීන්දු දීම පිණිස කම්කරු විනිශ්චය සභා සභාපතිවරයෙකු වශයෙන් වැඩ බැලීමට

1973 අප්‍රේල් මස 26 දින සිට මැයි මස 10 වැනි දින දක්වා බී. ඩී. ප්‍රනාන්දු මහතා කොළඹ අංක 16 16/876/71 436/69 සහ 1428/72 දරණ නඩු ඇසීම සහ අසා නිමකර තීන්දු දීම පිණිස වැඩ බලන කම්කරු විනිශ්චය සභා සභාපතිවරයෙකු වශයෙන් වැඩ බැලීමට.

1973 අප්‍රේල් මස 26 දින සිට 30 දින දක්වා එම්. ජී. එච්. ද අල්විස් මහතා කොළඹ 11 අංක. 11/392/68, 2194/71 සිට 2199/71 දක්වා ගාල්ල 11/ජී/6022, ජී/1261 සහ මාතර 11/මා/1007, මා/825, මා/962, මා/963, මා/1006 දරණ නඩු ඇසීමට සහ අසා අවසාන කර තීන්දු දීම පිණිස කම්කරු විනිශ්චය සභා සභාපතිවරයෙකු වශයෙන් වැඩ බැලීමට.

1973 අප්‍රේල් මස 24 දින සිට මැයි මස 4 වැනි දින දක්වා බී. ඩී. ප්‍රනාන්දු මහතා කොළඹ 16 අංක 16/1142/71, 790/71, 852/71, 1406/72, 16/1628/72, 1120/71, 641/70 දරණ නඩු ඇසීමට සහ අසා අවසාන කර තීන්දුව දීම පිණිස කම්කරු විනිශ්චය සභා සභාපතිවරයෙකු වශයෙන් වැඩ බැලීමට.

1973 අප්‍රේල් මස 10 වැනි දින සිට 24 දින දක්වා බී. ඩී. ප්‍රනාන්දු මහතා කොළඹ (16) 16/868/71, 1194/71, 1170/71, 1171/71, 192/69, 1075/71 දරණ නඩු අසා අවසාන කර තීන්දු දීම පිණිස කම්කරු විනිශ්චය සභා සභාපතිවරයෙකු වශයෙන් වැඩ බැලීමට.

# වෙනත් පත්කිරීම් ආදිය

### 1973 අංක 255

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

කොළඹ 12 ස්මිත් විදියේ අංක 29 පදිංචි මුරුගේසු ශන්මුගනාදන් මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ක්‍රි වූ අප්‍රේල් මස 7 දින,
කොළඹ දී ය.

05–142—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

### 1973 අංක 256

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

අංක 11 හාමර් පාරේ කොළඹ 6 පදිංචි දේවරාහන්දි ක්‍රිෂ්ණ මාලනී මංගලිකා මෙනෙවිය කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන; පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ක්‍රි වූ අප්‍රේල් මස 10 දින,
කොළඹ දීය.

05–187—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

### 1973 අංක 257

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

කෑගල්ල හෙට්මුල්ලේ පදිංචි අබදෙණි රාල්ලාගේ බිංගිරි අප්පු හාමි අබදෙණිය මහතා කෑගල්ලේ සිද්ධාර්ථ මාවතේ ප්‍රධාන කාර්යාල යද ඇතුව කෑගල්ල අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ක්‍රි වූ අප්‍රේල් මස 7 දින,
කොළඹ දී ය.

05–141—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

# ආණ්ඩුවේ නිවේදන

ඇල් ඩී.—බී 68/37

**වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත**

1964 අංක 44 දරන පනතින් සහ 1970 අංක 1 දරන පනතින් සංශෝධිත පරිදි වූ (469 වැනි අධිකාරය වන) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 71 වැනි වගන්තිය යටතේ නැව් කටයුතු හා සංචාරක කටයුතු ඇමතිවරයා විසින් පනවනු ලැබූ පහත සඳහන් නියෝගය ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරනු ලැබූ බව, ඒ ආඥාපනතේ 71 (3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

පී. බී. ජී. කළුගල්ල,
නැව් කටයුතු හා සංචාරක කටයුතු ඇමති.

1973. 04. 26 දින,
කොළඹ දී ය.

**නියෝගය**

වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 71 වැනි වගන්තිය යටතේ පනවනු ලැබ 1969 මාර්තු 7 වැනි දින අංක 14,844 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගවල 4 වැනි නියෝගය වෙනුවට පහත සඳහන් අලුත් නියෝගය ආදේශ කිරීමෙන් ඒ නියෝග මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"4. අවසර පත්‍රයක් සඳහා ගෙවිය යුතු ගාස්තුව පහත සඳහන් පරිදි විය යුතුය :

| | මසකට ගෙවිය යුතු මුදල රු. ශ. |
|---|---|
| යාත්‍රා කරන හෝ හබල් මගින් පදවන බෝට්ටුවකින් මසුන් ඇල්ලීම සඳහා ... | 25 0 |
| ගොඩබිමේ සිට බිලී පිත්තෙන් හා යොත් මගින් හෝ විසි දැල්වලින් කෙරෙන මසුන් ඇල්ලීම සඳහා ... ... | 5 0" |

05–178/1—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

ඇල්. ඩී.—බී 68/67

**වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත**

1964 අංක 44 දරන පනතින් හා 1970 අංක 1 දරන පනතින් සංශෝධිත පරිදි වූ (469 වැනි අධිකාරය වන) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 71 වැනි වගන්තිය යටතේ නැව් කටයුතු හා සංචාරක කටයුතු ඇමතිවරයා විසින් පනවනු ලැබූ පහත සඳහන් නියෝගය ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරනු ලැබූ බව ඒ ආඥාපනතේ 71 (3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

පී. බී. ජී. කළුගල්ල,
නැව් කටයුතු හා සංචාරක කටයුතු ඇමති.

1973. 04. 26 දින,
කොළඹ දී ය.

**නියෝගය**

වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 71 වැනි වගන්තිය යටතේ පනවනු ලදුව, 1938 අප්‍රේල් 29 වැනි දින අංක 8,366 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, වරින් වර සංශෝධිත පරිදි වූ නියෝග මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

(1) 4 වැනි නියෝගය වෙනුවට පහත සඳහන් අලුත් නියෝගය ආදේශ කිරීමෙන් :—

"(4) ආ ආකෘති පත්‍රයේ එක් එක් අවසර පත්‍රය සඳහා ඒ අවසර පත්‍රය වලංගුව පවතින කාල සීමාවේ එක් එක් දිනය වෙනුවෙන් පහත සඳහන් ප්‍රමාණයන් අනුව ගණන් බලන ලද ගාස්තුවක් ගෙවිය යුතු ය :—

ඉල්ලුම්කරු නේවාසිකයෙක් නම් ... රු. 2.00
ඉල්ලුම්කරු නේවාසිකයෙක් නොවේනම් ... රු. 5.00
පාසැල් සිසුන් සඳහා (එක් ළමයකුට) ශත 50";

(2) 4 අ නියෝගයෙහි නිශ්චිතව සඳහන් ගාස්තු ප්‍රමාණයන් වෙනුවට පහත සඳහන් අළුත් ගාස්තු ප්‍රමාණයන් ආදේශ කිරීමෙන් :—

| | ප්‍රමාණය රු. ශ. |
|---|---|
| රෝද හතරෙන් පැදවෙන සෑම මෝටර් වාහනයකටම ... ... | 10 0 |
| සෑම කාර් එකකටම ... ... | 5 0 |
| සෑම වෑන් රථයකටම ... ... | 7 50 |
| මගීන් ගෙනයන සෑම බස් රථයකටම හෝ ලොරියකටම ... ... | 10 0 |
| බඩු ගෙන යන සෑම ලොරියකටම ... | 20 0 |
| සෑම ගොන් කරත්තයකටම හෝ වෙනත් කරත්තයකටම ... ... | 2 0"; |

(3) 35 වැනි නියෝගයෙහි (2) වැනි ඡේදය වෙනුවට පහත සඳහන් අළුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(2) ඔ ආකෘති පත්‍රයේ අවසර පත්‍රයක් සඳහා ගෙවිය යුතු ගාස්තුව පහත සඳහන් ප්‍රමාණයන් අනුව විය යුතු ය :—

| | " ප්‍රමාණය | |
|---|---|---|
| | රු : | ශත |
| ආනයනය කෙරෙන එක් එක් තොගය සඳහා ... | 200 | 0 |
| අපනයනය කෙරෙන එක් එක්, තොගය සඳහා ... | | |

(4) 4 අ නියෝගයට ඉක්බිතිවම පහත සඳහන් අළුත් නියෝගය අන්තර්ගත කිරීමෙන් :—

"4ආ (i) වනෝද්‍යාන බංගලාවල නතරවීම සඳහා ගෙවිය යුතු ගාස්තුව අඩුම වශයෙන් තැනැත්තන් 5 දෙනෙකු සඳහා කෙරෙන වෙන් කිරීමෙන් වෙනුවෙන් එක් තැනැත්තෙකුට එක් දිනකට රු. 8.00 ක් විය යුතු ය.

(ii) එක් කූඩාරමක හෝ කිංස්ට්‍රෑන්ඩ් කුටියක වැඩිම වශයෙන් තැනැත්තන් 10 දෙනෙකු හා 20 දෙනෙකු නතරවීම සඳහා කූඩාරම් හෝ කිංස්ට්‍රෑන්ඩ් කුටි වෙනුවෙන් ගෙවිය යුතු ගාස්තුව පිළිවෙලින් දිනකට රුපියල් 2.50 ක් සහ දිනකට රුපියල් 5.00 ක් විය යුතු ය.

(iii) විශ්‍රාමශාලාවල නතරවීම සඳහා ගෙවිය යුතු ගාස්තුව එක් රැයකට එක් කණ්ඩායමකට රුපියල් 35 ක අවම ගාස්තුවක් විය යුතු අතර එක් තැනැත්තෙකුට එක් රැයකට රුපියල් 1.00 බැගින් විය යුතුය.

(iv) කඳවුරු බිම්වල නතරවීම සඳහා ගෙවිය යුතු ගාස්තුව එක් තැනැත්තෙකු සඳහා එක් දිනකට රුපියල් 2.50 ක් විය යුතු ය.

(v) වනෝද්‍යාන බංගලාවල දී රජයෙන් සපයනු ලබන ඇඳ ඇතිරිලි ආදී රෙදිපිළි පාවිච්චි කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණය කට්ටලයකට රුපියල් 5.00 බැගින් විය යුතු ය.

(vi) ඡායාරූප ගන්නා භූමි ප්‍රදේශයක් සඳහා ගෙවිය යුතු ගාස්තුව එක් දිනකට රු. 10.00"

05–178/2—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

### නිවැරදි කිරීම

වෘ 1954 වෙළඳ ශාලා සහ කාර්යාල සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) රෙගුලාසි

1973 පෙබරවාරි මස 23 වැනි දින අංක 48 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 1973 පෙබරවාරි 09 වැනි දින දරණ නිවේදනයේ "සේවක නියෝජිත සාමාජිකවරු" යටතේ අංක 3න් දක්වා ඇති නම ඇම්. ජෝශප් සිල්වා මහතා යනුවෙන් නිවැරදි විය යුතු ය.

ඇ. එ. ගෝගලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ ලේකම්.

1973 අප්‍රේල් මස 28 වැනි දින,
කොළඹ දී ය.

05–307—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

### ගෘහ සේවකයින් ලියාපදිංචි කිරීමේ ආඥාපණත (137 වැනි පරිච්ඡේදය)

කම්කරු ඇමතිතුමා විසින් ගෘහ සේවකයින් ලියාපදිංචි කිරීම පිළිබඳ ආඥාපණතේ (ලංකා ව්‍යවස්ථාපිත අණපනත්වල 1956 ප්‍රතිශෝධිත සංස්කරණයේ 137 පරිච්ඡේදය) 3 වැනි වගන්තිය යටතේ ත්‍රිකුණාමල ගෘහ සේවකයින් ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් වශයෙන් ඩබ්. ඩී. ද එස්. අබේවික්‍රම මහතා වෙනුවට ත්‍රිකුණාමල පොලිස් කාර්යාලයේ I වැනි පන්තියේ ලිපිකරු එල්. මරියතාසන් මහතා 1973. 03. 01 වැනි දින සිට පත්කර ඇත.

ඇ. එ. ගෝගලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ ලේකම්.

1973 අප්‍රේල් මස 27 වන දින,
කොළඹ දී ය.

05–191/1—73.05.10 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

### ගෘහ සේවකයින් ලියාපදිංචි කිරීමේ ආඥාපණත (137 වැනි පරිච්ඡේදය)

කම්කරු ඇමතිතුමා විසින් ගෘහ සේවකයන් ලියාපදිංචි කිරීම පිළිබඳ ආඥාපණතේ (ලංකා ව්‍යවස්ථාපිත අණපනත්වල 1956 ප්‍රතිශෝධිත සංස්කරණයේ 137 පරිච්ඡේදය) 3 වැනි වගන්තිය යටතේ හැටන් ගෘහ සේවකයින් ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් වශයෙන් ඇස්. නඩරාජා මහතා වෙනුවට හැටන් පොලිස් කාර්යාලයේ II පන්තියේ "අ" ඛණ්ඩයේ ලිපිකරු එච්. අබේගුණවර්ධන මහතා 1973. 01. 01 වැනි දින සිට පත්කර ඇත.

ඇ. එ. ගෝගලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ ලේකම්.

1973 අප්‍රේල් මස 27 වන දින,
කොළඹ දී ය.

05–191/2—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

### පඩිපාලක සභා ආඥාපනත

#### නිවේදනයයි

1973 මාර්තු මස 20 වැනි දින සිට අවුරුදු තුනක කාලයක් තුළ ඇඳුම් සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයින් වශයෙන් පෙනී සිටීමට (136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 9 වන වගන්තිය යටතේ කම්කරු ඇමතිතුමන් විසින් පහත නම් සඳහන් තැනැත්තන් පත් කරන ලද බව 1971 පඩිපාලක සභා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 30 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇ. එ. ගෝගලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ ලේකම්.

1973 අප්‍රේල් මස 28 වැනි දින,
කොළඹ දී ය.

**නම නියමකොට පත්කෙරෙන සාමාජිකවරු :**

(1) මහාචාර්ය ඒ. ඩී. වී. ද එස්. ඉන්ද්‍රරත්න මහතා
(2) ඩී. ජේ. මුණසිංහ මහතා
(3) ඇම්. ඇන්. ජයන්ත ජයරත්න මහතා

**සේව්‍ය නියෝජිත සාමාජිකවරු :**

(1) ආර්. ඇන් චොක්ෂි මහතා
(2) අජිත ද කොස්තා මහතා
(3) පී. ඇම්. සී. ප්‍රනාන්දු මහතා
(4) ලාල් හයිබ්‍රාමණී මහතා
(5) ඇම්. කුමාරස්වාමි මහතා
(6) ඩබ්ලිව්. ගනේගොඩ මහතා
(7) ඊ. ඇස්. අප්පදොරෙයි මහතා
(8) ඩබ්ලිව්. සෙල්ලමුත්තු මහතා
(9) කේ. විජයරත්නම් මහතා
(10) සී. ආර්. ප්‍රනාන්දු මහතා
(11) කේ. ඒ. ඩබ්ලිව්. ද සිල්වා මහතා
(12) ඩී. ඇල්. සී. ලියනගේ මහතා

**සේවක නියෝජිත සාමාජිකවරු :**

(1) ඇල්. කරුණා පෙරේරා මහත්මිය
(2) ඩී. පී. වෙත්තසිංහ මහතා
(3) බල්සි පොන්සේකා මහත්මිය
(4) කරුණා කළුපහන මහත්මිය
(5) කේ. පී. මල්ලිකා මහත්මිය
(6) එස්. එම්. ඩී. ඉන්ද්‍රපාල මහතා
(7) ඒ. පී. වසන්ත ද සිල්වා මහතා
(8) ඩබ්ලිව්. ඇල්. ප්‍රනාන්දු මහතා
(9) ඇන්. කරුණාරත්න මහතා
(10) සාමවිනිසුරු ඇම්. ඇම්. සෙනෙවිරත්න මහතා
(11) ඇම්. සී. ඇම්. ෂාෆි මහතා
(12) ඇම්. ස්ටීවන් ද කොස්තා මහතා

05–261—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

**පඩිපාලක සභා ආඥපනත**

**නිවේදනයයි**

මෝටර් රථ ගමනාගමන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයින් ලෙස 1973 අප්‍රේල් මස 25 වැනි දින සිට අවුරුදු 3ක කාලයක් තුළ සෙනී සිටීමට පඩිපාලක සභා ආඥපනතේ (136 වැනි අධිකාරය) 9 වැනි වගන්තිය යටතේ කම්කරු ඇමතිතුමන් විසින් පහත නම් සඳහන් තැනැත්තන් පත්කරන ලද බව වෂී 1971 පඩිපාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 30 වැනි ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇ. ඒ. ගෝගලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ ලේකම්.

1973 මැයි මස 03 වැනි දින.
කොළඹ දී ය.

**නම නියමකොට පත්කරන ලද සාමාජිකවරු**

(1) ඩබ්ලිව්. ද ඇස්. රත්නවීර මහතා
(2) පී. ඩී. අභයපාල මහතා
(3) ඊ. ඒ. පේරුසිංහ මහතා

**සේව්‍ය නියෝජිත සාමාජිකවරු**

(1) ජී. ආර්. ආර්. විජේවික්‍රම මහතා
(2) සී. රාජසූරිය මහතා
(3) ජී. එස්. අප්පදොරේ මහතා
(4) ඩබ්ලිව්. මොලගොඩ මහතා
(5) ඩී. කල්දේරා මහතා
(6) ඇන්. ඇම්. අප්පුහාමි මහතා
(7) ආර්. ජී. ප්‍රනාන්දු මහතා
(8) ජී. ජේ. ධම්රත්න මහතා
(9) ඩබ්ලිව්. උනම්බුවේ මහතා
(10) ඩී. ඇෆ්. කලුආරච්චි මහතා
(11) දොන් පියතිලක රණසිංහ මහතා.

**සේවක නියෝජිත සාමාජිකවරු**

(1) ඇල්. ඩබ්ලිව්. පණ්ඩිත මහතා
(2) ඇස්. ලෙස්ලි ප්‍රනාන්දු මහතා
(3) සර්ත් නාවාන මහතා
(4) ආනන්ද දසනායක මහතා
(5) ඩබ්ලිව්. කේ. සෙනෙවිරත්න මහතා
(6) ආර්. ජේසුදාසන් මහතා
(7) මහජන මන්ත්‍රී විමලසිරි පී. ද මැල් මහතා
(8) ඇම්. ඇම්. සෙනෙවිරත්න මහතා
(9) ආර්. ඇම් අප්පුහාමි මහතා
(10) එච්. එම්. චන්ද්‍රසේන මහතා
(11) ඇස්. සමල් ද සිල්වා මහතා.

05–306—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

**ලංකාවේ කෘෂිකම් සහ කම්මාන්ත ණය සංස්ථාව**

**කෘෂිකම් සහ කම්මාන්ත ණය සංස්ථාවේ අර්ථසාධක අරමුදලේ ව්‍යවස්ථා**

(1956 ලංකා නීති ප්‍රඥප්තියේ ප්‍රතිශෝධන සංස්කරණයේ 402 වැනි අධිකාරය වන) කෘෂිකම් සහ කම්මාන්ත ණය සංස්ථා ආඥපනතේ 51 (1) (කේ) වගන්තිය යටතේ පනවා අංක 9,920 හා 1948 නොවැම්බර් 19 වෙනි දින දරන ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබ, වරින්වර සංශෝධනය කරනලද අර්ථසාධක අරමුදලේ ව්‍යවස්ථා, කම්කරු කොමසාරිස්ගේ කැමැත්ත ඇති අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, උපලේඛනයෙහි දැක්වෙන පරිදි, නැවත වරක් සංශෝධනය කරනු ලැබ එකී ආඥපනතේ 86 වන වගන්තියේ 2 වන උප වගන්තිය ප්‍රකාර මුදල් ඇමතිතුමා විසින් ස්ථිර කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ආර්. ද සොයිසා,
මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්
වෙනුවට.

1973 අප්‍රේල් 25 වැනි දින,
කොළඹ.

**උපලේඛනය**

| ව්‍යවස්ථා විධිවිධාන | සංශෝධනයේ ස්වභාවය හා ප්‍රමාණය |
|---|---|
| 8. | අංක 8 දරන ව්‍යවස්ථාවේ (11) ඡේදය ලොප්කර ඒ වෙනුවට පහත සඳහන් අළුත් ඡේදය ආදේශ කෙරේ :— “(11). අරමුදලේ බැංකු ගිණුම් එක් භාරකරුවෙකු විසින් සහ සාමාන්‍යාධිකාරී විසින් ද සාමාන්‍යාධිකාරී නොමැති අවස්ථාවන් හි එම සාමාන්‍යාධිකාරී වෙනුවට වැඩබලන තැනැත්තා විසින් හෝ කෘෂිකම් සහ කම්මාන්ත ණය සංස්ථාවේ ගණකාධිකාරී හෝ ණය නිලධාරී විසින් ද ක්‍රියාත්මක කරනු ඇත.” |

05–160—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

**ආයුර්වේද වෛද්‍ය සභාව**

1961 අංක 31 දරණ ආයුර්වේද පණතේ 11 වන ඡෙදයේ (1) උප ඡෙදයේ සඳහන් ආයුර්වේද වෛද්‍ය සභාවට පහත නම් සඳහන් නියෝජිතයින් 1972 නොවැම්බර් මස 16 වැනි දින සිට ක්‍රියාත්මක වන සේ ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කර ඇති බව ප්‍රකාශයට පත් කරනු ලැබේ.

| නියෝජිත මහතුන්ගේ නම | ආයුර්වේද පණතේ අදල ඡෙදය |
|---|---|
| ආයුර්වේද කොමසාරිස් ... | ... II (i) (අ) |
| රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ විදුහල්පති | ... II (i) (ආ) |
| වෛද්‍ය, ඩී. එච්. අබේසේකර මහතා ...<br>වෛද්‍ය, එම්. එස්. පී. කුරේ විද්‍යාසේකර මහතා | II (i) (ඇ) |
| යක්කල (ගම්පහ) සිද්ධායුර්වේද වෛද්‍ය විද්‍යාලයේ වැඩ බලන විදුහල්පති, ජේ. ඩී. පී. ජයකොඩි මහතා | ... II (i) (ඈ) |
| වෛද්‍ය, එම්. සී. චන්ද්‍රසේන මහතා<br>වෛද්‍ය, කෙරමිණියේ ගරු අනෝමදස්සි හිමි<br>වෛද්‍ය, එම්. ඩී. ඩී. ගුණතිලක මහතා | II (i) (ඉ) |
| සාම විනිසුරු එස්. බී. විල්බට් සිල්වා මහතා<br>මහාචාර්ය, කේ. එල්. වී. අලගියවන්න මහතා | II (i) (ඊ)-i |
| වෛද්‍ය, එච්. පී. ඩබලිව්. ජීවානන්ද මහතා<br>වෛද්‍ය, ඩී. කේ. උක්වත්තගේ වෙදආරච්චි මහතා<br>වෛද්‍ය, ඒ. සරණපාල ගුණවර්ධන වෙදආරච්චි මහතා | II (i) (ඊ)-ii |
| වෛද්‍ය, එස්. පී. අත්තනායියර් මහතා<br>වෛද්‍ය, ටී. යූ. ද. සිල්වා මහත්මිය ...<br>වෛද්‍ය, එච්. ඇම්. ජෆාර් මහතා ...<br>වෛද්‍ය, එන්. ඊ. පෙරේරා මහතා ...<br>වෛද්‍ය, කේ. ආර්. ඩී. ඇම්. කරුණාරත්න මහතා | II (i) (ඊ)-iii |

සෝමදාස වීරතුංග,
සෞඛ්‍ය ලේකම්.

1973 අප්‍රේල් 30 දින,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
කොළඹදීය.

05–267—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

### ආයුර්වේද විද්‍යාල හා ආරෝග්‍යශාලා මණ්ඩලය

1961 අංක 31 දරණ ආයුර්වේද පණතේ 22 වන ඡෙදයේ (i) උප ඡෙදයේ සඳහන් ආයුර්වේද විද්‍යාල හා ආරෝග්‍යශාලා මණ්ඩලයට පහත නම් සඳහන් නියෝජිතයින් 1972 නොවැම්බර් මස 16 වැනි දින සිට ක්‍රියාත්මක වන සේ ගරු සෞඛ්‍ය ඇමති තුමා විසින් පත් කර ඇති බව ප්‍රකාශයට පත් කරනු ලැබේ.

| නියෝජිත මහතුන්ගේ නම | ආයුර්වේද පණතේ අදල ඡෙදය |
|---|---|
| ආයුර්වේද කොමසාරිස් ... ... | 22 (i) (අ) |
| රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ විදුහල්පති ... | 22 (i) (ආ) |
| ආයුර්වේද මහ රෝහලේ වෛද්‍ය අධිකාරි ... | 22 (i) (ඇ) |
| කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂ, බී. ජී. ඩී. ප්‍රනාන්දු මහතා ... | 22 (i) (ඈ) |
| කථිකාචාර්ය වෛද්‍ය, ඇම්. ඇම්. චන්ද්‍රසේන මහතා ... | 22 (i) (ඉ) |
| වෛද්‍ය, ඇම්. ඒ. ඇම්. ජලාල්දීන් මහතා<br>වෛද්‍ය, ඇම්. අයි. විලියම් මහතා ... | 22 (i) (ඊ) |
| යක්කල (ගම්පහ) සිද්ධායුර්වේද වෛද්‍ය විද්‍යාලයේ වෛද්‍ය ජෝර්ජ් වික්‍රමාරච්චි මහතා ... ... | 22 (i) (උ) |
| වෛද්‍ය, ඩී. ඩබ්ලිව්. ජී. ගුරුසිංහ මහතා<br>වෛද්‍ය, ඇ. අබේසිරි ගුණවර්ධන මහතා | 22 (i) (ඌ) |
| වෛද්‍ය, ඒ. එම්. ගුණවර්ධන වෙදආරච්චි මහතා<br>වෛද්‍ය, ඩී. ජේ. විජේවීර වෙදආරච්චි මහතා<br>වෛද්‍ය, ඇම්. ඒ. සිරිසේන මහතා ...<br>වෛද්‍ය, ඒ. කනගරත්නම් මහතා ... | 22 (i) (එ) |
| එම්. හලීම් ඉෂාක් මහතා ...<br>ඩැන්ටන් ජී. ඔබෙසේකර මහතා ... | 22 (i) (ඒ) |

සෝමදාස වීරතුංග,
සෞඛ්‍ය ලේකම්.

1973 අප්‍රේල් මස 30 වැනි දින,
කොළඹ 1,
සෞඛ්‍ය අමාත්‍යාංශයේ දීය.

5–268—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

### කොළඹ නගර සභාවේ මහජනාධාර කාරක සභාව

141 වන පරිච්ඡේදයේ දරිද්‍ර නීති ආඥපනතේ 12 වන ඡේදයේ (2) වන කොටස අනුව, 1975 මැයි මස 16 වන දිනෙන් අවසන් වන ලෙස සමාජ සේවා ඇමතිතුමා විසින් පත් කර ඇති ඉහත සඳහන් කාරක සභාවේ සාමාජිකයින් වන විවියන් ගුණවර්ධන මහත්මිය හා ඇන් ඩබ්. මුත් තයියා මහතා වෙනුවට එතුමා විසින් පහත නම් සඳහන් කර ඇති අය පත් කර ඇත :—

1. පී. ඇම්. පොඩිඅප්පුහාමි මහතා,
   අංක 53, ජයන්ත වීරසේකර මාවත,
   කොළඹ 10.

2. එස්. තිලෙයිනාදන් මහතා,
   අංක 60, අබ්දුල් කපූර් මාවත,
   කොළඹ.

ප. ධ. උඩුවෙල,
සමාජ සේවා අමාත්‍යාංශයේ ලේකම්.

1973 අප්‍රේල් මස 06 වැනි දින,
සමාජ සේවා අමාත්‍යාංශය,
අංක 14, බාන්ස් පෙදෙස,
කොළඹ 7.

5–293—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

### නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)

කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් අබ්දුල් හමීඩ් මොහමඩ් සුලෙයිමාන් මහතා විසින් (107 අධිකාරය වන) නොතාරිස්වරුන් පිළිබඳ ආඥපනතේ 22 (1) දරණ වගන්තිය යටතේ 1973 ක්වූ ජනවාරි මස 01 වැනි දින සිට නොතාරිස් ධුරයෙන් ඉල්ලා අස්වීමේ ලියකියවිලි ඉදිරිපත් කරන ලදුව රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් එකී දින සිට එම ඉල්ලා අස්වීම භාරගෙන තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

කොළඹ දී ය.
1973 ක්වූ මාර්තු මස 21 වැනි දින,

5–144—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

### නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)

ජේදුරුතුඩුව අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් කතිරවේලු වල්ලිපුරම් මහතා විසින් (107 අධිකාරය වන) නොතාරිස්වරුන් පිළිබඳ ආඥපනතේ 22 (1) දරණ වගන්තිය යටතේ 1973 ක්වූ පෙබරවාරි මස 02 වැනි දින සිට නොතාරිස් ධුරයෙන් ඉල්ලා අස්වීමේ ලියකියවිලි ඉදිරිපත් කරන ලදුව රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් එකී දින සිට එම ඉල්ලා අස්වීම භාරගෙන තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1973 ක්වූ මාර්තු මස 21 වැනි දින,
කොළඹ දී ය.

5–139—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

### නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)

බදුල්ල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් වෝල්ටර් ලියෝපෝල්ඩ් පින්ටෝ මහතා විසින් (107 අධිකාරය වන) නොතාරිස්වරුන් පිළිබඳ ආඥපනතේ 22 (1) දරණ වගන්තිය යටතේ 1972 ක්වූ දෙසැම්බර් මස 31 වැනි දින සිට නොතාරිස් ධුරයෙන් ඉල්ලා අස්වීමේ ලියකියවිලි ඉදිරිපත් කරන ලදුව රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් එකී දින සිට එම ඉල්ලා අස්වීම භාරගෙන තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1973 ක්වූ අප්‍රේල් මස 7 වැනි දින,
කොළඹ දී ය.

5–140—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

### ඉඩම් සංවර්ධන ආඥාපණත (320 වැනි අධිකාරය)

ඉඩම් සංවර්ධන ආඥා පණතේ 6 (1) වැනි වගන්තිය යටතේ කෘෂිකර්ම හා ඉඩම් ඇමතිවරයා විසින් පහත සඳහන් ප්‍රාදේශිය ආදායම් නිලධාරීන් ඔවුන්ගේ රාජකාරිවලට අමතර වශයෙන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දී ඇති දිස්ත්‍රික්කයන්හි එහි සඳහන් දිනයන්හි සිට ඉඩම් නිලධාරීන් ලෙස පත්කර තිබේ.:—

එස්. බී. සේනානායක,
අතිරේක ලේකම්,
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය.

1973.03.31 දින.

| නම | | දිස්ත්‍රික්කය | දිනය |
|---|---|---|---|
| ඩබ්ලිව්. ඒ. ඩබ්ලිව්. පෙරේරා මහතා | ... | ගාල්ල ... | 1973.01.21 |
| කේ. විජේසිංහ මහතා ... | ... | නුවරඑළිය ... | 1973.02.01 |
| එම්. ඩී. ඩී. එස්. ලියනගේ මහතා | ... | නුවරඑළිය ... | 1973.02.01 |

5–195—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

අංක : ඩබ්ලිව්. 105/1534.

### ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණාව පිළිබඳව ලංකා වතු කම්කරු සමිතිය, අංක 47, ජයන්ත වීරසේකර මාවත, කොළඹ 10 සහ ආර්. එෆ්. එස්. ද මෙල් මහතා සහ ආර්. එච්. ද මෙල් මහතා, මෙල්සිරිපුර, මිල්ලවාන වත්තේ අයිතිකරුවන්, එච්. එල්. ද මෙල් ඇන්ඩ් කොම්පැණි බාරේ ද මෙල් බිල්ඩිං, වැතැම් වීදිය, කොළඹ 1.,

අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති නැත්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, නුගේගොඩ පාගොඩ පාරේ, අංක 18 හි ජේ. ජී. එල්. ස්වාරිස් මහතා වෙත මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද. ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 අප්‍රේල් මස 24 වැනි දින,
කොළඹ දී ය.

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත

ලංකා වතු කම්කරු සමිතිය,
අංක 47, ජයන්ත වීරසේකර මාවත,
කොළඹ 10.,
සහ
ආර්. එෆ්. එස්. ද මෙල් මහතා සහ ආර්. එච්. ද මෙල් මහතා,
මෙල්සිරිපුර, මිල්ලවාන වත්තේ අයිතිකරුවන්,
එච්. එල්. ද මෙල් ඇන්ඩ් කොම්පැණි බාරේ, ද මෙල් බිල්ඩිං
වැතැම් වීදිය,
කොළඹ 1.,

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

**ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය**

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරවුලට හේතුවී ඇති කරුණු නම්, ඉහත සඳහන් වගන්තිය සමිතියේ සාමාජිකයෙක් වන, ආර්. ඇස්. මාරිමුත්තු මහතාගේ වේතනය, මෙල්සිරිපුර, මිල්ලවාන වත්තේ පාලක පක්ෂය විසින් අඩු කිරීම යුක්ති සහගතද යන්නත්, ඔහුට කුමන සහනයක් හිමිද යන්නත් පිළිබඳව වේ.

1973 අප්‍රේල් මස 10 වැනිදා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

5–136—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

අයි : සී/අයි. 1191.

### (1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරවුල් පනත

4 (1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් පනත (විශේෂ විධිවිධාන) සමඟ කියැවෙන) දරන (සංශෝධිත) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 1973 මාර්තු මස 09 දින අංක 50 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1973 පෙබරවාරි මස 12 වන දින දරන නියෝගයෙන් ලංකා ඉංජිනේරු කම්කරු සමිතිය, 71, මැලේ වීදිය, කොළඹ 2 සහ සීමාසහිත ඉම්ප්‍රෙග්නේෂන් ඇන්ඩ් වුඩ් ක්‍රාෆ්ට්, 111, මීගමු පාර, පෑලියගොඩ., අතර ඇති 1973 පෙබරවාරි මස 06 දින දරන ආරවුල පිළිබඳව කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳ වූ කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථය කිරීම සඳහා කොළඹ 6, කාලිංග පෙදෙසේ, අංක 6, ඒ. එස්. කොහොඹන් වික්‍රම මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළ යුතුයැයි දැන් පෙනියන හෙයින්, කම්කරු ඇමති වන මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, එකී නියෝගය අවලංගු කරන අතර, එකී 1973 පෙබරවාරි මස 12 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 අප්‍රේල් මස 24 දින,
කොළඹ දී ය.

5–159/1—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

අංක : සී/අයි 1191

### ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිතකර දක්වා ඇති කාරණය පිළිබඳව ලංකා ඉංජිනේරු කම්කරු සමිතිය, 71, මැලේ වීදිය, කොළඹ 2, සහ සීමාසහිත ඉම්ප්‍රෙග්නේෂන් ඇන්ඩ් වුඩ් ක්‍රාෆ්ට් 111, මීගමු පාර, පෑලියගොඩ., අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද, කම්කරු ඇමති නැත්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල, 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, ප්‍රජාපාල ශ්‍රී ගුණවර්ධන මහතා, ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙරකදෝරු තැන, ගම්පහ වෙත මෙයින් යොමු කරවනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 අප්‍රේල් මස 24 දින,
කොළඹ දී ය.

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත

ලංකා ඉංජිනේරු කම්කරු සමිතිය,
71, මැලේ වීදිය, කොළඹ 2,
සහ
සීමාසහිත ඉම්ප්‍රෙග්නේෂන් ඇන්ඩ් වුඩ් ක්‍රාෆ්ට්,
111, මීගමු පාර, පෑලියගොඩ,

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

**ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය**

ලංකා ඉංජිනේරු කම්කරු සමිතිය සහ සීමාසහිත ඉම්ප්‍රෙග්නේෂන් ඇන්ඩ් වුඩ් ක්‍රාෆ්ට් අතර පවතින කාර්මික ආරවුල වනුයේ,—

1. ජී. ඩබ්ලිව්. ජී. විජේදාස, ඇස්. බෙනඩික්ට්, ඇස්. ඇල්. චන්ද්‍රසිරි සහ ඒ. ඩබ්ලිව්. ඩී ජෝතිපාල යන මහත්වරුන් සේවයෙන් පහකිරීම යුක්ති සහගතද යන්න හා ඔවුන් එකිනෙකාට කුමන සහනයක් හිමිවිය යුතුද යන්න, සහ

2. ඩී. කේ. ප්‍රේමදාස, ආර්. ඒ. සිරිසේන, එච්. ඒ. නෝබට්, බී. නන්දසේන, කේ. ඩී. පී. අබේසිංහ, ඒ. ඇම්. නන්දසේන සහ ඩබ්ලිව්. ඩී. දයානන්ද යන මහත්වරුන් 1972. 09. 07 දින සිට දින 7ක් සේවයේ නොයෙදවීම සහ වේතන නොගෙවීම යුක්ති සහගතද යන්නත් පිළිබඳව වේ.

1973 අප්‍රේල් මස 3 වැනිදා වූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදි දිනා යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

5–159/2—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

අංක පී 7/1005.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරවුල් පනත.**

4 (1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් පනත (විශේෂ විධිවිධාන) සමග කියැවෙන) දරන (සංශෝධිත) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ලංකාවේ ව්‍යවස්ථාපිත අනපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 1973 ජනවාරි මස 12 දින අංක 42 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1972 දෙසැම්බර් මස 28 වන දින දරන නියෝගයෙන් හෝටල්, බේකරි, සාප්පු සහ බීම කම්කරු සමිතිය, 71, මැලේ වීදිය, කොළඹ 2 සහ ද ජැෆ්නා කෝපරේටිව් ස්ටෝර්ස් ලිමිටඩ්, 420, හොස්පිටල් රෝඩ්, යාපනය, අතර ඇති 1973 දෙසැම්බර් මස 16 දින දරන ආරවුල පිළිබඳව වැඩබලන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳ වූ කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථය කිරීම සඳහා කම්කරු විනිශ්චය සභා අංක 8 වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළ යුතුය යි දැන් පෙනීයන හෙයින්, කම්කරු ඇමති වන මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, එකී නියෝගය අවලංගු කරන අතර, එකී 1972 දෙසැම්බර් මස 28 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

එම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 අප්‍රේල් මස 24 දින,
කොළඹ දී ය.

5–149/1—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

අංක : පී. 7/1005.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත 4 (1) වන වගන්තිය යටතේ නිවේදනයයි**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිතකර දකවා ඇති කාරණය පිළිබඳව හෝටල්, බේකරි, සාප්පු සහ බීම කම්කරු සමිතිය, 71, මැලේ වීදිය, කොළඹ 2 සහ ද ජැෆ්නා කෝපරේටිව් ස්ටෝර්ස් ලිමිටඩ්, 420, හොස්පිටල් රෝඩ්, යාපනය, අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කම්කරු විනිශ්චය සභා අංක 13 වෙත මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 අප්‍රේල් මස 24 දින,
කොළඹ දී ය.

---

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත

හෝටල්, බේකරි, සාප්පු සහ බීම කම්කරු සමිතිය, 71, මැලේ වීදිය, කොළඹ 2 ;

සහ

ද ජැෆ්නා කෝපරේටිව් සටෝර්ස් ලිමිටඩ්, 420, හොස්පිටල් රෝඩ්, යාපනය,

අතර පවතින කාර්මික ආරුවුලක් පිළිබඳවයි.

**ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය**

ඉහත සඳහන් පාර්ශවයන් අතර ආරවුලට හේතුවී ඇති කාරණය නම්, ද ජැෆ්නා කෝපරේටිව් ස්ටෝර්ස් ලිමිටඩ්හි පාලක පක්ෂය විසින්, ඉහත සඳහන් සමිතියේ සාමාජිකයන් වන ඊ. වරදරාජා, කේ. අරුලානන්දන්, ඇස්. තවවෙල්වම්, වී. තුරේසිංහම්, ඇස්. තිලේනාදන් සහ කේ. නඩරාජා යන මහතුන්ට 1970/71 වර්ෂය සඳහා පාරිතෝෂික මුදල් නොගෙවීම යුක්ති සහගතද යන්නත්, ඔවුන් එකිනෙකාට කුමන සහනයක් හිමිද යන්නත් පිළිබඳව වේ.

1973 අප්‍රේල් මස 7 වැනිදා වූමෙදින, කොළඹ කම්කරු කොමසාරිස් කාර්යාලයේදී දිනා යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

5–149/2—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

අංක : ඩබ්ලිව්. 105/346.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරවුල් පනත**

**4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම**

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් පනත (විශේෂ විධිවිධාන) සමග කියැවෙන) දරන (සංශෝධිත) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 1969 මාර්තු මස 21 දින අංක 14,846 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1969 මාර්තු මස 7 වන දින දරන නියෝගයෙන් ලංකා කම්කරු සංගමය, අංක 72, ග්‍රීන්පාත් කොළඹ 7 සහ නාඟවිල්ල එස්ටේට්ස් කොම්පනි ලිමිටඩ් (දෙමෝදර නාඟවිල්ල වත්තේ අයිතිකරුවන්) සීමාසහිත ජෝර්ජ් ස්ටුවර්ට් කොම්පනි ලිමිටඩ් බාරේ, 45, රැජින වීදිය, කොළඹ, අතර ඇති 1969 මාර්තු මස 2 දින දරන ආරවුල පිළිබඳව කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳ වූ කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථය කිරීම සඳහා කම්කරු විනිශ්චය සභා අංක 5 බදුල්ල වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළ යුතුයැයි දැන් පෙනීයන හෙයින්, කම්කරු ඇමති වන මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, එකී නියෝගය අවලංගු කරන අතර, එකී 1969 මාර්තු මස 07 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

එම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 අප්‍රේල් මස 24 දින,
කොළඹදීය.

5–158/1—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

අංක : ඩබ්ලිව්. 105/346.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිතකර දක්වා ඇති කාරණය පිළිබඳව ලංකා කම්කරු සංගමය, අංක 72, ග්‍රීන්පාත්, කොළඹ 7 සහ කොළඹ 1, රජින විදියේ අංක 45 හි ජෝර්ජ් ස්ටුවර්ට් ඇන්ඩ් කොම්පැණි ලිමිටඩ් බාරේ (දෙමෝදර නහවිල්ල වත්තේ අයිතිකරුවන් වන) නහවිල්ල එස්ටේට්ස් කොම්පැණි ලිමිටඩ්, අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 5, පාක්වේ අංක 10 හි බී. කොස්වත්ත මහතා වෙත මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 අප්‍රේල් මස 24 දින,
කොළඹදීය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය-කාර්මික ආරවුල් පනත**

ලංකා කම්කරු සංගමය,
අංක 72 ග්‍රීන් පාත්,
කොළඹ 7.

සහ

කොළඹ 1, රජින විදියේ අංක 45 හි ජෝර්ජ් ස්ටුවර්ට් ඇන්ඩ් කොම්පැණි ලිමිටඩ් බාරේ (දෙමෝදර නහවිල්ල වත්තේ අයිතිකරුවන් වන) නහවිල්ල එස්ටේට්ස් කොම්පැණි ලිමිටඩ්.

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

යථෝක්ත පාර්ශ්වයන් අතර ආරවුලට හේතුවී ඇති කරුණ නම්, ආර්. රෙන්ගසාමි, දෙමෝදර, නහවිල්ල වත්තේ ලයින් කාමර අතුගෑමට ප්‍රතික්ෂේප කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් නහවිල්ල වත්තේ පාලක පක්ෂය විසින් ඔහු රැකියාවෙහි නොයෙදවීම යුක්ති සහගතද යන්නත්, ඔහුට කුමන සහනයක් හිමිද යන්නත් පිළිබඳව වේ.

1973 අප්‍රේල් මස 10 වැනිදා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

5–158/2—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

අංක ව් 7/1007.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව සමස්ත ලංකා පළාත් පාලන කම්කරු සමිතිය, 67, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 10 සහ මීගමුව නගර සභාව, මීගමුව අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරණ පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 4, සාන්ත පීතර පෙදෙසේ අංක 21 හි පදිංචි එම්. මතියාපරනම් මහතා වෙත මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 අප්‍රේල් මස 24 වෙනි දින,
කොළඹ දී ය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත**

සමස්ත ලංකා පළාත් පාලන කම්කරු සමිතිය,
67, ආනන්ද රාජකරුණා මාවත,
කොළඹ 10

සහ

මීගමුව නගර සභාව,
මීගමුව

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරවුලට හේතුවී ඇති කරුණ නම්, ඉහත දැක්වෙන වෘත්තීය සමිතියේ සාමාජිකයෙක් වන කේ. ඇස්. ඒ. පී. ප්‍රනාන්දු මහතා 1963. 10. 27 සිට රු. 750—13×42 රු. 1,296 වැටුප් පරිමාව මතද 1969. 10. 10 සිට රු. 2,640—15×60—රු. 3,540 සංශෝධිත වැටුප් පරිමාව මත මීගමුවේ නගර සභාව විසින් නොතැබීම යුක්ති සහගතද යන්නත් ඔහුට කුමන සහනයක් හිමිද යන්නත් පිළිබඳව වේ.

1973 අප්‍රේල් මස 02 වැනිදා වූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස් කාර්යාලයේ දී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

ĸ-310—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

අංක සී/අයි. 1039.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් පනත (විශේෂ විධිවිධාන) සමග කියැවෙන) දරන (සංශෝධිත) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 1972 ජූලි මස 7 දින අංක 15 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1972 ජූනි මස 21 වන දින් දරන නියෝගයෙන් සිලෝන් බැන්ක් ඔපිසර්ස් ඇසෝසියේෂන්, 32, බ්‍රිස්ටල් හොටෙල් බිල්ඩිං, යෝර්ක් වීදිය, කොළඹ 1 සහ ඉන්ඩියන් බැන්ක්, තැ. පෙ. 624, 48, බේලි වීදිය, කොළඹ 1, අතර ඇති 1972 ජූනි මස 13 දින දරන ආරවුල පිළිබඳව වැඩබලන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථය කිරීම සඳහා නුගේගොඩ, පාගොඩ පාරේ, අංක 18 හි ජේ. ජී. ඇල්. ස්වාරිස් මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළ යුතුයැයි දැන් පෙනියන හෙයින්, කම්කරු ඇමති වන මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, එකී නියෝගය අවලංගු කරන අතර, එකී 1972 ජූනි මස 21 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 අප්‍රේල් මස 24 වැනි දින,
කොළඹ දී ය.

5–146/1—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

අංක සී/අයි 1039.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිතකර දක්වා ඇති කාරණය පිළිබඳව, කොළඹ 1, බේලි වීදියේ, අංක 48 හි, ඉන්ඩියන් බැන්ක් බාරේ, එන්. මුතුකුමාරු මහතා සහ කොළඹ 1, බේලි වීදියේ, අංක 48 හි, ඉන්ඩියන් බැන්ක් අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරණ පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, නුගේගොඩ, පාගොඩ පාරේ, අංක 18 හි ජේ. ජී. එල්. ස්වාරිස් මහතා වෙත මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 අප්‍රේල් මස 24 වැනි දින,
කොළඹ දී ය.

---

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත**

එන්. මුතුකුමාරු මහතා,
ඉන්ඩියන් බැන්ක් බාරේ,
48, බේලි වීදිය,
කොළඹ 1,

සහ

ඉන්ඩියන් බැන්ක්,
48, බේලි වීදිය,
කොළඹ 1

අතර කාර්මික ආරවුලක් පිළිබඳවයි.

ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරවුලට හේතුවී ඇති කරුණ නම්, කොළඹ, ඉන්ඩියන් බැන්ක් හි සේවයේ යොදවා සිටි ප්‍රාදේශීය නිලධාරි, එන්. මුතුකුමාරු මහතා, තල්ගොඩපිටිය ප්‍රදානය පදනම් කරගත්, ඒකාබද්ධ වැටුප මත ගණන් බැලූ විශ්‍රාම වැටුපකට හිමිකම් ඇත්තේ ද යන්න පිළිබඳව වේ.

1973 මාර්තු මස 31 වැනි දා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

5–146/2—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

අංකය : සීඅයිර්/163/73.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය, (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත, 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව, එක් පාර්ශ්වයක් වශයෙන්, කොළඹ 3, සැන්ට් කිල්ඩාස් පටුමගේ, 12 හි ඩී. පී. වෙල්ලයියා මහතා හා අනෙක් පාර්ශ්වය වශයෙන් (1) උඩපුස්සැල්ලාව, ගෝඩන් වත්තේ, අයිතිකරුවන් වන කොළඹ 1 රජින වීදියේ 14 හි, ජෝර්ජ් ස්ටුවර්ට් ඇන්ඩ් කම්පැණි ලිමිටඩ් බාරේ ද ස්ටෑන්ඩඩ් ටී කම්පැණි ඔෆ් සිලෝන් ලිමිටඩ් සහ (2) ද ස්ටෑන්ඩඩ් ටී කම්පැණි ඔෆ් සිලෝන් ලිමිටඩ් හි ඒජන්තවරුන් වන කොළඹ 1, රජින වීදියේ 14 හි ජෝර්ජ් ස්ටුවර්ට් ඇන්ඩ් කම්පැණි ලිමිටඩ් අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, ගල්කිස්සේ, පිරිවෙන පාරේ අංක 54 හි පදිංචි අද්වකාත් ජී. ඩබ්. එදිරිවීර මහතා මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 අප්‍රේල් මස 24 දින,
කොළඹ දී ය.

---

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත

එක් පාර්ශ්වයක් වශයෙන්, කොළඹ 3, සැන්ට් කිල්ඩාස් පටුමගේ, 12 හි ඩී. ජී. වෙල්ලයියා මහතා හා අනෙක් පාර්ශ්වය වශයෙන්, (1) උඩපුස්සැල්ලාව, ගෝඩන් වත්තේ, අයිතිකරුවන් වන, කොළඹ 1, රජින වීදියේ 14 හි, ජෝර්ජ් ස්ටුවර්ට් ඇන්ඩ් කම්පැණි ලිමිටඩ් බාරේ, ද ස්ටෑන්ඩඩ් ටී කම්පැණි ඔෆ් සිලෝන් ලිමිටඩ් සහ (2) ද ස්ටෑන්ඩඩ් ටී කම්පැණි ඔෆ් සිලෝන් ලිමිටඩ් හි ඒජන්තවරුන් වන කොළඹ 1, රජින වීදියේ, 14 හි ජෝර්ජ් ස්ටුවර්ට් ඇන්ඩ් කම්පනි ලිමිටඩ් අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

**ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය**

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර, ආරවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ උඩපුස්සැල්ලාව, ගෝඩන් වත්තේ පාලක පක්ෂය විසින් උඩපුස්සැල්ලාව ගෝඩන් වත්තේ සහකාර වතු පාලක ඩී. ජී. වෙල්ලයියා මහතාගේ සේවය අවසන් කිරීම යුක්ති සහගතද යන්න හා ඔහුට කුමණ සහනයක් හිමිවිය යුතුද යන්නත් පිළිබඳව වේ.

1973 අප්‍රේල් මස 03 වැනිදා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ල දී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

5–259—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

මගේ අංකය : සී/අයි. 1176.

**කාර්මික ආරවුල් පනත—131 වන පරිච්ඡේදය**

1957 අංක 14 හා 62, 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා 1972 දෙසැම්බර් මස 5 වන දින දරන නියෝගයෙන් යොමුකරන ලදුව 1972 දෙසැම්බර් මස 22 දින අංක . 39 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළකරනලද, කාර්මික හා සාමාන්‍ය කම්කරු සමිතිය, 71. මැලේ විදිය, කොළඹ 2 සහ පී. ඩී. ලයිමන් මහතා, අයිතිකරු, තිස්ස ග්‍රයින්ඩින් මිල්ස්, 71, සුනේත්‍රා දේවි පාර, කොහුවල, අතර පවැතුන කාර්මික ආරවුල පිළිබඳව බේරුම්කරු විසින් මා වෙත එවන්නට යෙදුනු තීරණය, ඉහත සඳහන් කරනලද පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් පළකරනු ලැබේ.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

1973 අප්‍රේල් මස 25 වැනි දින,
කොළඹ 5, කම්කරු දෙපාර්තමේන්තුවේ දීය.

**ඒ1206**

කාර්මික හා සාමාන්‍ය කම්කරු සමිතිය
71, මැලේ විදිය, කොළඹ 2.

සහ

පී. ඩී. ලයිමන් මහතා,
අයිතිකරු, තිස්ස ග්‍රයින්ඩින් මිල්ස්,
71, සුනේත්‍රා දේවි පාර, කොහුවල.

අතර කාර්මික ආරවුල

**තීරණය**

මේ තීරණය 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පණත් වලින් සංශෝධිත වූ ලංකා ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 17 වන වගන්තිය යටතේ කරන ලද්දකි.

2. එය ඉහත සඳහන් දෙපක්ෂය අතර පවතින කාර්මික ආරාවුල පිළිබඳවයි.

3. ඉහත සඳහන් කම්කරු ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ගරු කම්කරු ඇමතිතුමා වෙත පැවරී ඇති බලතල අනුව එතුමා විසින් 1972. 12. 5 වෙනි දින කරන ලද නියෝගයෙන් එකී ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත් කොට ඇත.

4. එකී නියෝගයට අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ සඳහන් වී ඇති පරිදි දෙපක්ෂය අතර ආරාවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ පහත සඳහන් (කාර්මික හා සාමාන්‍ය කම්කරු සමිතියෙ සාමාජිකයින් වන) සේවකයන් 21 දෙනා තිස්ස ග්‍රයින්ඩින් මිල්ස් අයිතිකරු පී. ඩී. ලයිමන් මහතා විසින් 1970 දෙසැම්බර් මස සිට සේවයේ නොයෙදවීම යුක්තිසහගතද යන්න හා ඔවුන් එකිනෙකාට කුමන සහනයන් හිමිද යන්නත් පිළිබඳව වේ.

| | |
|---|---|
| 1. සෝමපාල වල්පොල. | 11. එල්. බේබිසිඤෝ. |
| 2. ජී. ඒ. හේමපාල. | 12. එස්. ගුණසේන. |
| 3. එම්. ඒ. ජිනසේන. | 13. ආර්. චාලට්. |
| 4. හෙන්රි පීරිස්. | 14. සී. ජී. සෝමාවතී. |
| 5. එස්. ඇලෝසියස් ප්‍රනාන්දු. | 15. දයාවතී ගෝමස්. |
| 6. ආර්. දයානන්ද. | 16. සී. ඇලන්. |
| 7. කේ. පුණ්‍යදාස. | 17. ඒ. රාමනායක. |
| 8. ඩබ්ලිව්. චන්ද්‍රදාස පෙරේරා. | 18. එම්. එච්. අයිරින් සිල්වා. |
| 9. යූ. කේ. වීරරත්න. | 19. සී. පියදාස පෙරේරා. |
| 10. එස්. පී. අරනෝලිස්. | 20. සී. විමලසේන පෙරේරා. |
| 21. එස්. ඩී. පුණ්‍යදාස. | |

5. ඉහත සඳහන් ආරාවුලට හේතුවූ කාරණය හා ඊට අදාල ප්‍රශ්න විභාග කිරීමේදී කාර්මික හා සාමාන්‍ය කම්කරු සමිතිය වෙනුවෙන් එහි ප්‍රධාන නියෝජිත වික්ටර් ඩී මෙල් මහතා 1973.1.27 වෙනි දින සහ 1973.2.14 වෙනි (අවසාන) දින පෙනී සිටි අතර එකී සමිතියේ ලේකම් ඩබ්ලිව්. එල්. ප්‍රනාන්දු මහතා 1973.2.2 වෙනි දින පෙනී සිටියේය. තිස්ස ග්‍රයින්ඩින් මිල්ස් අයිතිකරු පී. ඩී. ලයිමන් මහතා වෙනුවෙන් 1973.1.27 වෙනි දින නීතිඥ එච්. ජයවර්ධන මහතා පෙනී සිටි අතර, 1973.2.2 සහ 1973.2.14 වෙනි දිනයන්හි නීතිඥ ගුරුසිංහ මහතා පෙනී සිටියේය.

6. දෙපක්ෂයේ කැමැත්ත හා එකඟත්වය ඇතුව කම්කරු කොමසාරිස් වරයාගේ ඉහත සඳහන් ප්‍රකාශයෙන් අංක 8 දරන ඩබ්ලිව්. චන්ද්‍රදාස පෙරේරා, අංක 11 දරන ඇල්. බේබි සිංඤෝ, අංක 12 දරන ඇස්. ගුණදාස, අංක 14 දරන සී. ජී. සෝමාවතී යන සේවකයින් හතර දෙනාගේ නම් අස් කර ගන්නා ලදී. ඉන් අනතුරුව දෙපක්ෂයේ කැමැත්ත සහ එකඟත්වය ඇතුව මිල්ටන් ප්‍රනාන්දු සහ සුනිල් පතිරණ යන සේවකයින් දෙදෙනාගේ නම් අංක 22 සහ අංක 23 ලෙස එකී ප්‍රකාශයනට ඇතුළත් කරන ලදී. තවද, එකී ප්‍රකාශනයේ සඳහන් නාම ලැයිස්තුවේ 16 වැන්නාගේ නම සී. ඊලන් ලෙසද, 19 වැන්නාගෙ නම පී. පියදාස පෙරේරා ලෙසද 20 වැන්නාගේ නම බී. විමලසේන පෙරේරා ලෙසද සංශෝධනය කරන ලදී.

7. ඉන්පසු දෙපක්ෂය අතර පවතින කාර්මික ආරාවුල රටේ ආර්ථික තත්වය සලකා බලා පහත සඳහන් සමාදාන සම්මුතිය අනුව දෙපක්ෂයේම කැමැත්ත ඇතුව බේරුම්කර ගැනීමට තීරණය කරන ලදී.

(i) ඉහත සඳහන් ලෙස සංශෝධනය කරන ලද කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ සඳහන් සේවක සේවිකාවන් හට එක් එක් සේවකයා හෝ සේවිකාවගේ සේවා කාලය අනුව එක් සේවක වර්ෂය වෙනුවෙන් මාස භාගයක වේතනයක් පාරිතෝෂික මුදලක් වශයෙන්ද ඊට අමතරව සෑම සේවකයෙකුටම හෝ සේවිකාවකටම එක මාසෙක වේතනයක් විශේෂ දීමනාවක් වශයෙන්ද සේව්‍ය පක්ෂය වන පී. ඩී. ලයිමන් මහතා විසින් ගෙවිය යුතුය. මේ සඳහා සේවා කාලය ගණන් බැලීමේදී යම් සේවා කාලයක් වර්ෂයකට අඩු වුවද එය හය මාසයකට වැඩි නම් එක සේවා වර්ෂයක් ලෙස සැලකිය යුතුය.

(ii) යම් සේවකයෙකු හෝ සේවිකාවකට හිමිවූ අන්තිම මාසයේ පඩියෙන් යම් කොටසක් නොගෙවා ඇත්නම් ඒ කොටසද ඉහත සඳහන් දීමනාවල් සමග ගෙවිය යුතුය.

(iii) මෙසේ එක් එක් සේවකයෙකුට හා සේවිකාවකට පී. ඩී. ලයිමන් මහතා විසින් ගෙවිය යුතු සම්පූර්ණ මුදල පහත දක්වේ:—

| | | රු. ශ. |
|---|---|---|
| 1. සෝමපාල වල්පොලට | ... | 293.80 |
| 2. ජී. ඒ. හේමපාලට | ... | 232.32 |
| 3. එම්. ඒ. ජිනසේනට | ... | 224.51 |
| 4. හෙන්රි පීරිස්ට | ... | 386.28 |
| 5. එස්. ඇලෝසියස් ප්‍රනාන්දුට | ... | 321.93 |
| 6. ආර්. දයානන්දට | ... | 228.42 |
| 7. කේ. පුණ්‍යදාසට | ... | 241.80 |
| 9. යූ. කේ. වීරරත්නට | ... | 363.35 |
| 10. එස්. පී. අර්නෝලිස්ට | ... | 807.27 |
| 13. ආර්. චාලට්ට | ... | 401.71 |
| 15. දයාවතී ගෝමස්ට | ... | 327.60 |
| 16. සී. ඊලන්ට | ... | 723.87 |
| 17. ඒ. රාමනායකට | ... | 378.95 |
| 18. එච්. එම්. අයිරින් සිල්වාට | ... | 232.70 |
| 19. පී. පියදාස පෙරේරාට | ... | 717.07 |
| 20. බී. විමලසේන පෙරේරාට | ... | 411.05 |
| 21. එස්. ඩී. පුණ්‍යදාසට | ... | 183.95 |
| 22. මිල්ටන් ප්‍රනාන්දුට | ... | 290.17 |
| 23. සුනිල් පතිරනට | ... | 212.50 |
| එකතුව | ... | 6979.25 |

(iv) මෙලෙස සේව්‍ය පක්ෂය වන පී. ඩී. ලයිමන් මහතා විසින් ගෙවිය යුතු සම්පූර්ණ මුදල වන රු. 6,979.25 න් භාගයක් ($\frac{1}{2}$) 1973.4.10 දින හෝ ඒ දිනට පෙරද, එකී සම්පූර්ණ මුදලෙන් හතරෙන් කොටසක් ($\frac{1}{4}$) 1973.05.31 දින හෝ එදිනට පෙරද, එකී මුදලෙන් ඉතුරු හතරෙන් කොටස ($\frac{1}{4}$) 1973.06.30 දින හෝ එදිනට පෙරද, දකුණු කොළඹ සහකාර කම්කරු කොමසාරිස්වරයා වෙත තැන්පත් කළ යුතුය.

8. ආරාවුල සමථයකට පත් කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් සමාදාන සම්මුතියේ කොන්දේසි යුක්තිසහගත සහ සාධාරණ බැව් මට පෙනී යන බැවින් ඒවා අනුමත කර මගේ තීරණය දෙමි.

එච්. සමරනායක,
බේරුම්කරු.

1973.03.01 දින,
කොළඹ දීය.

05–186—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

# මිළ පාලන දැන්වීම

අංක. කේ්යු/76/73 දරණ ආහාර මිළ නියෝගය

පාන්

**මිළ පාලන පනත**

**ආඥාව**

කුරුණෑගල පාලන දිස්ත්‍රික්කයේ සහකාර(ආහාර) මිළ පාලක තැන්පත්, සතරසිංහගේ දෙන් සුගත්දස වන මම (173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ 4 වෙනි ඡේදය හා 3(2) වෙනි ඡේදයන්ගෙන්ද මාවෙත පැවරී ඇති බලතල අනුව—

(1) 1973 පෙබරවාරි මස 02 වැනි දින අංක 45 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පල කරන ලද 1973 ජනවාරි මස 19 වැනි දින අංක කේ්යු/75/73 දරණ ආහාර මිළ නියෝගය මේ දුන් සිට අවලංගු කරමි.

(2) මෙහි වූ උපලේඛනයේ දෙවෙනි හා තුන්වෙනි තීරවල සඳහන් මිළ එම උපලේඛනයේ පළමුවෙනි තීරයේ සඳහන් ප්‍රදේශවල, පිළිවෙලින් අවුන්ස 16 සහ 8 වෙ (දහසය සහ අටෙ) පාන් ගෙඩි විකිණිය හැකි වැඩිම මිළ මේ දුන් පටන් බවත්, එකී මිළට වැඩියෙන් එම ප්‍රදේශවල එම පාන් ගෙඩි නොවිකිණිය යුතු බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද මෙම මිළ නියෝගයෙන් කිසියම් ප්‍රදේශයක් සඳහා අවුන්ස 16 පාන් ගෙඩියකට නියමිත වැඩිම මිලේ අනුපාතය අනුව වැටහෙන මිළට වැඩියෙන්, එම ප්‍රදේශය තුළ අවුන්ස අටකට වඩා බර පාන් ගෙඩියක් හෝ පාන් ගෙඩියකින් අවුන්ස අටකට වඩා බර කිසියම් කොටසක් නොවිකිණිය යුතු බවත්,

(4) මෙම මිළ නියෝගයෙන් කිසියම් ප්‍රදේශයක් සඳහා අවුන්ස අටේ පාන් ගෙඩියකට නියමිත වැඩිම මිලේ අනුපාතය අනුව වැටෙහන මිළට වැඩියෙන් එම ප්‍රදේශය තුළ අවුන්ස අටකට වඩා බර නොවූ පාන් ගෙඩියක් හෝ ගෙඩියකින් අවුන්ස අටකට වඩා බර නොවූ කිසියම් කොටසක් නොවිකිණිය යුතු බවත්,

(5) පාන් විකුණන විට ඔතා දෙනු ලබන දෙයක් වෙතොත් එහි මිළත් මෙම නියෝගයෙන් නියමිත වැඩි මිළ ගණන්වලට ඇතුළත් බවත්,

(6) මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කොට ඇති සෑම ප්‍රදේශයකම සිය ස්වාමිත්වය හෝ පාලනය යටතේ කිසියම් ස්ථානයක හෝ වාහනයක පාන් ඇති වෙළෙන්දෙකු මෙම නියෝගයෙන් පාන් සඳහා නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් පැහැදිළිව පෙනෙන සේ එම ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බවත්,

(7) මෙම නියෝගයෙන් වැඩිම මිළ නියෝග කොට ඇති සෑම ප්‍රදේශයකම පාන් විකුණන සෑම කෙනෙක්ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය,

(ආ) විකුණූ පාන් ගෙඩියේ විස්තර,

(ඇ) විකුණූ පාන් ප්‍රමාණය,

(ඈ) විකුණූ පාන්වලට ගෙවූ මුදල ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවත් මෙම නියෝගයෙන් නියෝග කරමි.

(8) තවද, ''අවුන්ස'' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත අවුන්සයේ බර බවද නියෝග කරමි.

1973 අප්‍රේල් මස 26 වැනි දින පෙරවරු 10 ට කුරුණෑගල කච්චේරියේ දී අත්සන් කරන ලදී.

ඇස්. ඩී. සුගතදස,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක.

### උපලේඛනය

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>අවුන්ස 8 කට වඩා බර පාන් සඳහා අදළ වැඩිම මිළ | | | 3 වැනි තීරය<br>අවුන්ස 8ක් හෝ ඊට අඩු පාන් සඳහා අදළ වැඩිම මිළ | | |
|---|---|---|---|---|---|---|
| | | රු. | ශ. | | රු. | ශ. |
| කුරුණෑගල නාගරික සීමාව තුළ ... ... ... ... ... | අවු. 16ක් | 0 | 40 | ... අවු. 8ක් | 0 | 20 |
| කුරුණෑගල නාගරික ප්‍රදේශය හැර කුරුණෑගල පාලන දිස්ත්‍රික්කයට අයත් අන්‍ය සියළු පෙදෙස් තුළ ... | අවු. 16ක් | 0 | 41 | ... අවු. 8ක් | 0 | 20 |

සැළකිය යුතුයි.—මේ මිළ ගණන් පාන් විකිණිය යුතු නියමිත මිළ නොවේ. මේවා පාන් විකිණිය හැකි උපරිම මිළ ගණන් වේ. එම මිළ ගණන්වලට ඉහළින් පාන් විකිණිය නොහැක.

5–138—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය, දකුණු දිසාව— හිනිදුම කොට්ඨාශය

### වාහන ගමනා ගමනයට බාධා කිරීම—යටලමත්ත උඩුගම පාරේ 5/1 දරණ පාලම අලුත්වැඩියා කිරීම

ඉහත සඳහන් පාලමේ අලුත්වැඩියාවන් නිමාවන තුරු එය සියලුම රථවාහන සඳහා වසා තබන බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

උඩුගමට යාම පිණිස ගාල්ල—උඩුගම පාර යොදාගත හැකිය.

ඇස්. පද්මනාදන්,
දිසා වැඩ අධ්‍යක්ෂ,
දකුණු දිසාව.

දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලය,
දකුණු දිසාව, ගාල්ල,
1973 අප්‍රේල් මස 24 දින දීය.

5–189—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

## වට්ටාපලෙයි කන්නගි අම්මාන් කෝවිල් පොන්ගල් උත්සවය —1973

ඉහත සඳහන් කෝවිලේ වාර්ෂික උත්සවය සිරිත් පරිදි මෙවරද, 1973 මැයි මස 14 වැනි දින පෙරවරු 6 ට ආරම්භ කෙරෙන බැව් මහජනයාගේ හා මේ සම්බන්ධයෙන් උනන්දුවන් නන්ගේ දැන ගැනීම පිණිස මෙයින් නිවේදනය කරමි.

වට්ටාපලෙයි කන්නගි අම්මන් කෝවිලේ පොන්ගල් උත්සවය පිළිබඳව වණි 1949.05.27 වැනි දිනැති අංක 9,978 හා 1950. 05. 26 වැනි දිනැති අංක 10,105 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රවල පළ වූ නිවේදනවලට, මෙම උත්සවයට සහභාගි වන වන්දනාකරුවන්ගේ හා මේ සම්බන්ධයෙන් උනන්දුවන් නන්ගේත් අවධානය යොමු කරවනු ලැබේ.

ප්‍රසිද්ධියට පත් කරන ලද මෙම නිත්‍ය රෙගුලාසි පූර්වෝක්ත උත්සවය පැවැත්වෙන කාලසීමාව තුළ වලංගු වෙනවා ඇත.

එස්. සිවඥනම්,
වවුනියා අතිරේක දිසාපති,

1973 අප්‍රේල් මස 27 වැනි දින,
වවුනියා දිසාපති කාර්යාලයේ දී ය.

5–190—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

**1958 අංක 29 දරණ සත්ව පණත**

**1973 වර්ෂයට අම්පාර දිස්ත්‍රික්කයේ කරවාහු පත්තුවේ හංවඩු ගැසීමේ ස්ථානයන් හා දිනයන්**

| ග්‍රා.සේ. අංකය | ග්‍රා.සේ. කොට්ඨාශය | හංවඩු ගසන දිනය | හංවඩු ගසන ස්ථානය |
|---|---|---|---|
| 47 | කො. අංක 6, සයින්දමරුතු | 10.6.73 සහ 17.6.73 | ග්‍රා.සේ. කාර්යාලය |
| 47ඒ | කො. අංක 4/5, එම | 18.6.73 සහ 19.6.73 | එම |
| 50 | කො. අංක 2/3, එම | 20.6.73 සහ 21.6.73 | එම |
| 52 | කො. අංක 1, එම | 22.6.73 සහ 23.6.73 | එම |
| 53 | දෙ. කො. එම | 25.6.73 සහ 26.6.73 | එම |
| 54 | කො. අංක 5, කල්මුණේකුඩි | 8.6.73 සහ 9.6.73 | එම |
| 55 | කො. අංක 4, එම | 10.6.73 සහ 11.6.73 | එම |
| 56 | කො. අංක 2/3, එම | 10.6.73 සහ 11.6.73 | එම |
| 58 | කො. අංක 1, එම | 24.6.73 සහ 25.6.73 | එම |
| 59 | කො. අංක 3, කල්මුණේ | 19.6.73 සහ 20.6.73 | එම |
| 61 | කො. අංක 1/2, එම | 17.6.73 සහ 18.6.73 | එම |
| 62 | දෙ. කො. නායිපට්මුණේ | 19.6.73 සහ 21.6.73 | එම |
| 64 | මු. කො. එම | 20.6.73 සහ 30.6.73 | එම |
| 66 | කො. අංක 1/2, පාන්ඩිරුප්පු | 8.6.73 සහ 9.6.73 | එම |
| 67 | කො. අංක 2, මරුදමුණේ | 10.6.73 සහ 11.6.73 | එම |
| 68 | කො. අංක 1, එම | 12.6.73 සහ 13.6.73 | එම |
| 69 | වෙනෙයිකුඩිරුප්පු | 23.6.73 සහ 24.6.73 | එම |
| 71 | කො. අංක 2, පෙරියනීලාවනෙයි | 9.6.73 සහ 10.6.73 | එම |
| 72 | කො. අංක 1, පෙරියනීලාවනෙයි | 16.6.73 සහ 17.6.73 | එම |

ඩී. විජේසිංහ,
අම්පාර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත

1973.04.25 වෙනි දින,
අම්පාර කච්චේරියේදීය.

5–179—73.05.11 දින අංක 59 දරන ගැසට් පත්‍රය

---

ණය අංකය : 3636.

**ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාව**

(402 වන අධිකාරය වන) කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථා ආඥාපනතේ 71 වන වගන්තිය යටතේ යෝජනාව

1972 දෙසැම්බර් 15 වෙනි දින සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගත් බව මෙයින් නිවේදනය කරනු ලැබේ:—

" ප්‍රසිද්ධ නොතාරිස් තැන්පත් සී. ඇස්. වික්‍රමසිංහ විසින් ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාව නමට ලියා සහතික කරන ලද අංක 5100 හා 1970.4.24 දින දරන බැඳුම්කරයෙහි සඳහන් ගෙවීම් දැනට මඩල් කුඹුර, පල්ලේගම පදිංචි ධනපාල බුවනසේකර අඹන්වෙල (පල්ලේගම බුද්ධරක්කිත ථෙරෝ වශයෙන් පෙර හැඳින්වූ) නමැති අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය යටතේ රුපියල් පන්දාස් අටසිය දොළහයි සත එකොළහක් (රු. 5,812.11) එකී සංස්ථාවට දැනට අයවිය යුතු හෙයින් ද, එකී අංක 5100 දරන බැඳුම්කරය මඟින් එකී සංස්ථාවට උකස් කර ඇත්තාවූ බදුල්ල දිස්ත්‍රික්කයේ, එට්මොලේ ගමේ පිහිටි අංක 34570 දරන මුල් ඔප්පු ප්ලෑනේ ඒකාබද්ධ කැබලි 219 සහ 231 වශයෙන් දක්වා ඇති එකී ප්ලෑන ප්‍රකාර අ. 149, රූ. 2, ප. 35 ක ප්‍රමාණයෙන් යුත් දඹගොල්ලේ යාය, කොඩිතරවය, කොකාවිද්ද මඩේයාය, වෙලන් කැටියාය, කල්ගහකොනේ මූකලාන, කොඩින්නෝ අරාවෙයාය සහ ගැඹුබගස්යාය නමැති ඉඩම සහ එහි තුළ ඇති සියළුම දේද බදුල්ලේ පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ජේ. ඇම්. අපබ්තුංග මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමටත්, එසේ විකුණා එකී මුදල් හෝ එසේ විකුණන අවස්ථාවේදී එයින් ආපසු නොගෙවා ඉතිරිව ඇති පොළියත්, එකී ආඥාපනතේ 78 වන වගන්තියේ විධිවිධාන යටතේ ප්‍රචාරක, විකුණුම් හා වෙනත් ගාස්තුද සමග අයකර ගැනීමටත් කෘෂිකර්ම හා කර්මාන්ත ණය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි. "

එච්. ඇස්. ඇෆ්. ගුණවර්ධන.
සාමාන්‍යාධිකාරී.

1973 අප්‍රේල් මස 12 වැනි දින,
කොළඹ 3.

5–317—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අනිතිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පලකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුයි. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය** සඳහා ආණ්ඩුවේ මුද්‍රණාල්යාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම **දයක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව |
|---|---|---|---|
| අප්‍රේල් | 73.04.19 බ්‍රහස්පතින්ද | ... | 73.04.11 බදාද දවල් 12.00 |
| | 73.04.27 සිකුරාද | ... | 73.04.19 බ්‍රහස්පතින්ද දවල් 12.00 |
| මැයි ... | 73.05.04 සිකුරාද | ... | 73.04.27 සිකුරාද දවල් 12.00 |
| | 73.05.11 සිකුරාද | . | 73.05.04 සිකුරාද දවල් 12.00 |
| | 73.05.18 සිකුරාද | ... | 73.05.11 සිකුරාද දවල් 12.00 |
| | 73.05.25 සිකුරාද | ... | 73.05.18 සිකුරාද දවල් 12.00 |
| ජූනි | 73.06.01 සිකුරාද | ... | 73.05.25 සිකුරාද දවල් 12.00 |
| | 73.06.08 සිකුරාද | ... | 73.06.01 සිකුරාද දවල් 12.00 |
| | 73.06.14 බ්‍රහස්පතින්ද | ... | 73.06.08 සිකුරාද දවල් 12.00 |
| | 73.06.22 සිකුරාද | ... | 73.06.14 බ්‍රහස්පතින්ද දවල් 12.00 |
| | 73.06.29 සිකුරාද | ... | 73.06.22 සිකුරාද දවල් 12.00 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.